14

# කෝලම් ගැමි නාටකයේ අන්තර්ගත සම්භාව්‍ය ලක්ෂණ

*ඒ. අයි. තත්සරා* [1]
HU/2012/0103

කෝලම් ගැමි නාටකයක් ලෙස හැඳින්වීමේ යුක්ති යුක්ත බව විග්‍රහ කිරිම මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණයි. පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත ''කෝලම්'' විනෝදාස්වාදය හා ගර්භ ශාන්තියක් අපේක්ෂා කොට ගෙන ඉදිරිපත් කෙරෙන ගැමි නාටක විශේෂයකි. එසේ වුව ද, කෝලම් හි ගැඹුරු ශාස්ත්‍රිය ගුණාංගයන්ගෙන් පෝෂිත අංගද අන්තර්ගතය. මෙම අධ්‍යයනයේ නියැදි ලෙස උපයෝගී කරනුයේ අම්බලන්ගොඩ ජුවන්වඩු පරම්පරාවට අයත් කෝලම් නාටක පෙළය. දැනට ලේඛන ගතව පවතින මූලාශ්‍ර මෙන්ම ක්ෂේත්‍ර ගවේෂණය මඟින් ලබාගන්නා දත්ත ද ඉහත අරමුණ විශ්ලේෂණයට යොදා ගැනීමට අපේක්ෂිත ය. පූජා විධි, වෙස් මුහුණු, නර්තන-ගායන-වාදන යන කරුණු ඔස්සේ එකී කරුණ විශ්ලේෂණයට භාජනය වේ. කෝලම් මඩුවක් ආරම්භයේ මංගල භේරි වාදනය මධ්‍යයේ තෙරුවන් නමැද ආශිර්වාද කවි ගායනා කරයි. ''සබයෙහි'' ගොක්කොළ එල්ලා සීමාව ලකුණු කරයි. මෙය පහතරට ශාන්ති කර්මයන්හි පූජා විධි රටාවට නෑකම් කියාපායි. කෝලම් නාට්‍යයට අයත් වෙස් මුහුණු මූර්ති ශිල්පීය ශාස්ත්‍රීය නියමයන් අනුව නිර්මාණය කරයි. නොංචි, හේවාරාළ, නාගරාක්ෂ, සිංහ ආදී වෙස් මුහුණු රාශියක් මෙම රංගයට යොදා ගැනෙයි. ''මහා සම්මත'' වෙස් මුහුණ තුළින් සංසාරය, නිර්මාණය ආදිය විශද කෙරේ. නර්තනය හා බෙරවාදනය ද ශාස්ත්‍රීයත්වයෙන් පරිපූර්ණ ය. ''ගුං දැහිං ගුද ගුද දැහිමි'' යන බෙර පදයට 'ගම්වල සැම තැන''යන කවිය ගයමින් ජසයා ඉදිරිපත් කරන නිරුපණය සංකීර්ණ ය. මුගුරු පාලියේ ද මෙම පදය යොදාගනී. කෝළම් රංගනයක් අවසානයේ ''ගරායක් නැටුම'' සිදුකරන බව ජුවන්වඩු කෞතුකාගාරයේ සඳහන්ව ඇත. ආංගික, වාචික, ආහාර්ය, අභින ද, ශාන්තිකර්ම ලක්ෂණ, පහතරට ශාස්ත්‍රීය නර්තන ලක්ෂණ ද කෝලම් හි අන්තර්ගතය. මෙකී පර්යේෂණ පත්‍රිකාව මඟින් ඉදිරිපත් කළ කරුණු අනුව ''කෝලම්'' ගැමි නාටකයෙන් ඔබ්බට ගිය සම්ප්‍රදායික පදනමක පිහිටමින් ගැමි විඥානය ද පෝෂණය කරන විදග්ධ කලාවක් බව පිළිගැනීම යුක්ති සහගත ය.

ප්‍රමුඛ පදඃ ගැමි නාටක, කෝලම්, ශාස්ත්‍රිය ගුණාංග

*1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) දෙවන වසර*